DOI: 10.31357/fhssmst.2010.00016

# ඉඩම් පැවරීමේ නීති ක්‍රියාත්මක කිරීමේදී මතුවන සන්නිවේදන ගැටලු

රාජපක්ෂ වලිමුණි මුදියන්සේලාගේ
කපිල බණ්ඩාර වලිමුණි

''ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ
ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා
ජන සන්නිවේදනය විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධයයි''

මේ ශාස්ත්‍රීය නිබන්ධය මා විසින් සම්පාදනය කරන ලද බවත්,
මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ
වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ
වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා
ඉදිරිපත් නොකරන ලද බව සහතික කරමි.

(ආර්.ඩබ්ලිව්.එම්.කේ.බී. වලිමුණි)

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
31 MAY 2010
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

## පටුන


පිටුව

01. අනුමෝදනාව i

02. පිදුම iii

03. නිබන්ධ සාරාංශය iv

04. **පළමුවන පරිච්ඡේදය**

ඉඩම් පිළිබඳ ඉතිහාසය 1

05. **දෙවන පරිච්ඡේදය**

රජයේ ඉඩම්

2.1 ඉඩම් කොමසාරිස් ජෙනරාල් දෙපාර්තමේන්තුව 22

2.2 ඉඩම් සංවර්ධන ආඥා පනත 33

2.3 ඉඩම් නිදහස් කිරීමේ ආඥා පනත 41

2.4 රජයේ ඉඩම් ආඥා පනත 46

2.5 ඉඩම් අත්කර ගැනීමේ පනත 53

2.6 ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත 60

2.7 රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත 66

2.8 ග්‍රාම නිලධාරීන්ගේ කාර්යභාරය 70

2.9 රජයේ අනෙකුත් ආයතන සතු ඉඩම් 85

06. **තුන්වන පරිච්ඡේදය**

පළාත් සභා සහ මධ්‍යම ආණ්ඩුව අතර පවතින ඉඩම් ගැටලු 89

07. **හතරවන පරිච්ඡේදය**

පෞද්ගලික ඉඩම් හා වෙනත් නීති යටතේ පවතින ඉඩම්

4.1 පෞද්ගලික ඉඩම් 101

4.2 ආගමික ආයතන සතු ඉඩම් 118

4.3 උඩරට නීතිය හා ඉඩම් 129

4.4 තේසවලමෙ නීතිය හා ඉඩම් 142

4.5 මුස්ලිම් නීතිය හා ඉඩම් 149

4.6 රෝම ලන්දේසි නීතිය හා ඉඩම් 155

4.7 ඉංග්‍රීසි නීතිය හා ඉඩම් 161

08. **පස්වන පරිච්ඡේදය**

සමාජයීය ගැටලු 164

09. ආශ්‍රිත ග්‍රන්ථ, අණපනත්, සම්මුඛ සාකච්ඡා හා වෙබ් අඩවි 170

## අනුමෝදනාව

නිර්ධන පන්තියේ මිනිහෙකුට ඉලක්කයක් ඇතුව අධ්‍යාපනය ලැබීමේදී මතුවන්නාවූ දුක්ගැහැට එමටය. ජීවත්වීමේ මහා යුද්ධයත් සමඟ මේ සියල්ල කළ යුතුව ඇත. එය මට ද එකසේ සාධාරණය. කෙසේ නමුත් හිතේ හයියට ඉලක්කය කරා යන ගමනේ දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ ඇදුරුතුමන්ලා හා කාර්ය මණ්ඩලය ලබා දුන් සහයත්, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ නියෝජ්‍ය ලේඛකාධිකාරිතුමිය, මහේෂ් මහතා ඇතුළු කාර්යය මණ්ඩලය ලබා දුන් සහයත් ඉතා ගෞරවයෙන් සිහිපත් කරමි.

විවිධාකාර හේතු නිසා අතපසුවෙමින් තිබූ නිබන්ධය හැකි ඉක්මනින් නිමා කළ යුතු බවට නිතර නිතර මට දිරි දුන් හිතවතුන් කිහිප දෙනෙකු සිටී. එයින් කවදාවත් මට අවවාද අනුශාසනා ලබා දෙන මහින්ද කුමාර දළුපොත සොහොයුරා ආදරයෙන් සිහිපත් වෙයි. එමෙන්ම ජනසන්නිවේදන ශාස්ත්‍රපති උපාධිය හැදෑරූ සුදත්, ආනන්ද, ජයසිරි, විජිත්, ජගත්, ඇතුළු සියලුම සගයින් ද නිතරම මා දිරිමත් කළ බව සඳහන් නොකළොත් එය මහත් අඩුපාඩුවකි.

විෂය කරුණු අධ්‍යයනය කිරීමේදී බොහෝ පිරිසක් මට සහය දක්වන ලදී. සම්මුඛ සාකච්ඡා මගින් එම තොරතුරු නොඅඩුව ලබා දෙමින් සහය දක්වූ එම සම්පත් දායක මහත්ම මහත්මීන් සිහිපත් කරන්නේ හදපිරි භක්තියෙනි. තමාගේ කටයුත්තකටත් වඩා උනන්දුවෙන් ඉතාමත් හොඳින් මෙම නිබන්ධය පරිගණක යතුරුලියනය කර දුන් සරත් ගුණතිලක සහෝදරයාට ද මගේ ස්තුතිය හදපත්ලෙන්ම පිරිනමමි.

මෙහි නම් වශයෙන් සඳහන් කළ පිරිස පමණක් නොව, වචනයකින් හෝ මා දිරිමත් කළ බොහෝ ලෙන්ගතු හිතවතුන්, හිතවතියන් රාශියක් ද සිටී. මා කෙසේවත් මේ මොහොතේ ඔවුන් අමතක නොකරමි. එමෙන්ම මා අධෛර්යමත් කළ අය නොසිටියා නොවේ. ඒ මේ සමාජයේ හැටිය. මේ කටයුත්ත නිමා කිරීමට මම එය අභියෝගයක් සේ සලකා භාරගෙන ශක්තිමත් වූවෙමි.

**චමුක බණ්ඩාර වලිමුණි**

**පිදුම!**

බහ තෝරන වයසේ සිට

මේ මොහොත දක්වාම

ජීවිතය ජය ගන්ට

මග පෙන්වූ, ගුරුහරුකම් දුන්

ආදරණීය මවට, පියාට,

ගුරු මෑණිවරුන්ට, පියවරුන්ට,

සෙනෙහසින්!

# ඉඩම් පැවරීමේ නීති ක්‍රියාත්මක කිරීමේදී මතුවන සන්නිවේදන ගැටලු


## ආර්.ඩබ්ලිව්.එම්.කේ.බී. වලිමුණි


## නිබන්ධ සාරාංශය


නිබන්ධය පරිච්ඡේද පහකින් යුක්තවේ. සන්නිවේදන ගැටලු පිළිබඳ අදහස් දැක්වීමේදී "ඉඩම්" සම්බන්ධයෙන් නානාවිධ කරුණු අධ්‍යයනය කළ යුතුව ඇත. මන්ද ශ්‍රී ලංකාවේ ඉඩම් සම්බන්ධව රජකාලයේ සිටම අපහැදිලි හා සංකීර්ණ තත්ත්වයක් පැවති බැවිනි. ඉඩම්වල අයිතිය හා බුක්තියේ විවිධාකාර ස්වරූපයන් පැවතී ඇත. එහෙයින් පළමු පරිච්ඡේදයෙන් ඉඩම් පිළිබඳ ඉතිහාසයත් එහි පැවතියාවූ සංකීර්ණත්වය හා ගැටලු සහගත අවස්ථාවන් පිළිබඳ සඳහන වේ.

දෙවන පරිච්ඡේදය වෙන් වන්නේ රජයේ ඉඩම් පිළිබඳ හැඳින්වීමටත් එම ඉඩම් පරිහරණය හා බැහැ කිරීම සම්බන්ධව පවතින අණපනත් විග්‍රහ කිරීමටත්, රජයේ විවිධ ආයතන සතු ඉඩම් පරිහරණය කරන්නේ කෙසේදැයි කරුණු ඉදිරිපත් කිරීමටත්ය. එමෙන්ම රජයේ විවිධ නිලධාරීන්ගේ ක්‍රියාකාරිත්වය ද විවිධ ආයතන හා කටයුතු කිරීමේදී ඇති වන්නාවූ ගැටලු සහ ඒවා හඳුනා ගන්නේ කෙසේ දැයි සොයා බැලීමටත්ය. රජයේ ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන අණපනත් සැහෙන සංඛ්‍යාවක් ඇත. එම ප්‍රධාන අණපනත් හා එකිනෙක අතර පවතින වෙනස්කම් හා ගැටලුසහගත තත්ත්වයන් ද මේ යටතේ සාකච්ඡා කෙරේ.

13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ඉඩම් විෂයට අදාළ සැහෙන බලතල ප්‍රමාණයක් පළාත් සභාවලට පවරා ඇත. කෙසේ නමුත් මෙම පැවරීම හේතුකොට ගෙන රජයේ ඉඩම් පරිපාලනයේදී ගැටලු රාශියකට මුහුණදීමට සිදුව ඇත. සියලුම බලතල පළාත්

සභාවට ඇතැයි පළාත් සභා පවසන අතර එසේ නැතැයි මධ්‍යම ආණ්ඩුව පවසයි. ඉඩම් බැහැර කිරීම වැනි කාරණාවලදී පළාත් සභා ක්‍රියාකාරිත්වය සහ මධ්‍යම ආණ්ඩුවේ විශේෂයෙන්ම ජනාධිපතිගේ මැදිහත්වීම යන කරුණු දෙකම සම්පූර්ණ විය යුතුව ඇත. කෙසේ නමුත් මේ තත්ත්වය ගැටලු සහගතය. තුන්වන පරිච්ඡේදයෙන් මේ පිළිබඳව විග්‍රහ කෙරේ.

හතරවන පරිච්ඡේදය වෙන් වන්නේ පෞද්ගලික ඉඩම් හා වෙනත් නීති රීති යටතේ ශ්‍රී ලංකාවේ ඉඩම් පරිහරණය වන්නේ සලකා බැලීම සඳහාය. විශේෂයෙන්ම ජාතීන් අනුව හා පිහිටි ප්‍රදේශ අනුව ප්‍රාදේශීය නීති හා සිරිත් විරිත් අනුවද ඉඩම්වල අයිතියේ හා පරිහරණයේ වෙනස්කම් දකිය හැකිය. මෙම වෙනස්කම් මත විවිධ සංකීර්ණ තත්ත්වයන්ට ඉඩම් හිමිකරුවන්ට මුහුණදීමට සිදුව ඇත. මේ පිළිබඳව හැදෑරීම ගැටලු අවම කරගැනීමට රුකුලක් වේ. සමහර අවස්ථාවල අධිකරණය පවා එකිනෙකට ප්‍රතිවිරුද්ධ තීන්දු ලබා දුන් අවස්ථා ඇත. එයින්ම මෙහි සංකීර්ණත්වය පෙන්නුම් කෙරේ.

රජයේ ඉඩම් මෙන්ම පුද්ගලික ඉඩම් පිළිබඳවද කථා කිරීමේදී පවතින්නාවූ සංකීර්ණ තත්ත්වය හේතුකොට ගෙන විවිධාකාරවූ සමාජීය ගැටලු පැනනැගී ඇත. එනිසාම ශ්‍රී ලංකාවේ ඉඩම් සංවර්ධනය කිරීමට අපහසු තත්ත්වයක් පැනනැගී ඇත. එහෙයින් ඉඩම් ගැටලු නිරාකරණයට හා පරිහරණයට අලුත් ක්‍රමවේද අවශ්‍යව ඇත. එවැනි කරුණු පිළිබඳ හඳුනා ගැනීමක් පස්වන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ.

අවසාන වශයෙන් මෙම අධ්‍යයනය සඳහා තොරතුරු ලබා ගත් පොත්පත් හා මූලාශ්‍ර පිළිබඳව හා සාකච්ඡා කරන ලද අයවලුන් සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීමක් ඇත.

පළමුවෙනි පරිච්ඡේදය

## ඉඩම් පිළිබඳ ඉතිහාසය

සිංහල රජ දවස රටේ පැවති සියලුම ඉඩකඩම් අයිතිව තිබුණේ සිංහලයේ රජතුමන්ටය. අයිතිය රජතුමා සතුවුවත් රටේ ජනතාවට ඒවා වගාකිරීමටත්, බුක්තිවිදීමටත්, ඒ අනුව රජුට (රජයට) බදු ගෙවීමටත් හැකියාව තිබුණි. විවිධාකාර ලෙස ඉඩම් බුක්තිය ඉතිහාසයේ සිට පැවත එන ලදී. සිංහලයකු රජුට සියලුම ඉඩම්වල අයිතිය ඇත්තේය යන කාරණය අවිවාදයෙන් පිළිගත්හ. එමෙන්ම සිංහලයේ මුල්ම රජු ලෙසට සැලකෙන විජයගේ සිට මේ අයිතිය රජුගෙන් රජුට පැවරුණු බවටද විශ්වාස කරනු ලබයි.

එසේ වුව ද පුරාතන හා මධ්‍යකාලීන ලංකාවේ ඉඩම් අයිතිය හා හිමිකම බෙහෙවින්ම සංකීර්ණ විය. ශ්‍රී ලංකාවේ රජ දවස ඉඩම් අයිතිය පිළිබඳව පර්යේෂණ කළ බොහෝ විද්වතුන්ගේ අදහස වූයේ රටේ සියලුම ඉඩම්වල හිමිකරු රජු ලෙසය. මේ සඳහා බොහෝ විට හේතුවන්නට ඇත්තේ රජු හැඳින්වීම සඳහා සාහිත්‍යයේ හා වංශකථාවල පෘථුවිශ්වර, භූපති, පෘථ්විපති, වත්හිමි, මහීපති ආදී යෙදුම් භාවිතය නිසා ගම්‍ය වූ අදහස විය හැක. නැතිනම් ශ්‍රී ලංකාව යටත් කරගත් පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යන පිටදේශක්කාරයින්ට වාසි පිණිස වියහැක. මන්ද සියලුම ඉඩම් රජු යටතේ පැවතුන හෙයින් ඒවා තමා යටතේ ද පැවතිය යුතු හා පවතින්නේය යන අදහස ජනතාවට දිය හැකි හෙයිනි. එහෙයින් ඒ අනුව තමන්ට ඉතා වාසි සහගත ඉඩම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ හැකිය. වර්තමානය වන විටත් බොහෝ රටවල් ඉඩම් සම්බන්ධයෙන් යටත්විජිත ක්‍රියාකාරිත්වය සාධාරණීකරණය කිරීමට මෙම අදහස උපයෝගිකර ගනී.

කෙසේ වුවද සත්‍ය එය නොවන බව මෙරට ඉතිහාසය ප්‍රවේශමෙන් හැදෑරීමේදී පෙනීයන කරුණකි. එදා රජ දවස ජනතාවට ඉඩම් මිලදී ගැනීමට, විකිණීමට හා ප්‍රදානය කිරීමට

හිමිකම තිබී ඇත. මේ සඳහා රජුගේ අවසරය පවා අවශ්‍ය නොවී තිබුණ බවට සාධක සොයාගෙන ඇත. ක්‍රි.ව. පලමුවෙනි ශතවර්ෂයේ කුරුණෑගල ගල්ලෙන විහාරස්ථ සෙල්ලිපියේ එම ලෙන, ගොඩ ඉඩම හා කුඹුරක් ද 'මතය' නම් අයෙකු විසින් භික්ෂුවකට ප්‍රදානය කරන ලද බව සඳහන් වෙයි. ක්‍රි.ව. දහවන ශතවර්ෂයට අයත් එප්පාවල ශිලා ලිපියක වෙලාත්මෙ මිහිඳු නම් අය උකුණුහස කෝත්තා නම් අයට රත්තරන් කළං අටකට කුඹුරක් විකිණූ බව සඳහන් කරයි. එමෙන්ම දඹදෙණියේ II වන පරාක්‍රමබාහු රජු සමයේ (ක්‍රි.ව. 1236-1270) බෙන්තොට ගලපාත විහාරයට යම් අයෙකු මිලදී ලබාගත් ඉඩමක් පරිත්‍යාග කර ඇති බව එම විහාරස්ථ ශිලාලිපියේ සඳහන් වෙයි. ගඩලාදෙණි විහාරයට ද මෙවැනිම මිලදීගත් ඉඩමක් පරිත්‍යාග කර ඇත.

රජතුමා විසින් ඉඩකඩම් හා කුඩා ප්‍රමාණයේ වැව් මිලයට ගන්නා ලද අවස්ථා පිළිබඳව ද ඉතිහාසය සාක්ෂි දරයි. විහාරගල ශිලාලිපියේ සඳහන් වන්නේ සුභ රජු (ක්‍රි.ව. 60-67) විසින් කහවණු 500කට මිලට ගන්නා ලද වැවක් භික්ෂූන් වහන්සේලාට පූජාකරන ලද බවයි.

ඉඩම් පැවරීම, විකිණීම, මිලයට ගැනීම ආදී කරුණු මත පමණක් අයිතිය පිළිබඳව විග්‍රහ කළහොත් යටත් විජිත සමයට පෙර පුද්ගලික ඉඩම් අයිතිය පැවති බවට නිගමනය කළ හැක. පුරාතනයේ ඉඩම් මිලදී ගැනීමේ දී හොඳ ක්‍රමවේදයක් තිබී ඇත. යම්කිසි වගාකරුවෙක් පදිංචිවී සිටින ඉඩමක් මිලයට ගැනීමට හෝ ප්‍රදානය කිරීමට ද පිළිවන්කම තිබුණි. නමුත් එහි පදිංචිකරුවන්ගේ අයිතියට කිසිදු ආකාරයක ගැටලුවක් ඇති නොවන ලෙසට මෙය සිදුකරනු ලැබීය. එලෙසින් බලන කල එය අදට වඩා සාධාරණ ක්‍රමවේදයක් බව සඳහන් කළ යුතුය.

### ඉඩම්වල රජු සතුවූ අයිතිවාසිකම්

රාජ්‍යයෙ ඉඩම් සම්බන්ධයෙන් රජතුමාට විවිධ අයිතිවාසිකම් හා බලතල තිබුණි. විශේෂයෙන් වගාකරන ලද ඉඩම්වලින් බද්දක් එකතුකිරීමේ අයිතිය රජ සතුවිය. එම අයිතිය රජුට ලැබුණේ ඔහු සතු ඉඩම් හිමිකමක් මත නොව රාජ්‍ය සහ එහි වෙසෙන ජනතාවත් රජු විසින් ආරක්ෂා කරනු ලබන හෙයිනි. එමෙන්ම කැලෑ ඉඩම් හා කිසිවක් වගා නොකරන ලද ඉඩම් ද රජතුමා

සතුවිය. නමුත් මේවායෙ ඔහුට  පෞද්ගලික අයිතියක් නොතිබූ බව සඳහන් වේ. එය ''රජ'' යන තනතුරට අයත් විය. යම් පුද්ගලයෙකුට හේන් වගාවකට හෝ අස්වද්දා ගැනීමට ඉඩම් අවශ්‍යවූ විට ඒ ගැන රජතුමාට සැලකර සිටිය හැක. මන්ද රජයට ආදායම් ලැබුණේ වගාවෙන් නිසාවෙනි.

අස්වාමික ඉඩම් රජු සතුය යන පදනම මත යම්යම් ඉඩම් හා දේපොල රජයට පවරා ගැනීමට ද හැකියාව තිබුණි. පදිංචිවී සිට හෝ වගාකර පසුව අතැරදමූ ඉඩම් හා ගොඩනැගිලි මෙසේ රජයට අයත් ඒවා ලෙසට සැලකේ. ගැටලුකාරී තත්ත්වයක් මත (ක්‍රි.ව. 270-301) අනුරාධපුරයේ මහා විහාර භික්ෂූන් විහාරය අතහැර ගොස් සිටියදී එම දේපල රජයට පවරා ගන්නා ලද බව සඳහන්ය.

යම්කිසි රාජ්‍යද්‍රෝහී හෝ අපරාධ සම්බන්ධයෙන් කෙනෙකු වරදකරුවකු වූ විට ඔහු සතු ඉඩම් රජයට පවරා ගත හැකිවිය. ධාතුසේන රජුගේ (ක්‍රි.ව. 455-473) පාලනයට පෙර බලයේ සිටි දෙමළ රජවරුන්ට සහයෝගය දක්වූ  සිංහල ප්‍රභූන්ගේ ඉඩම් ධාතුසේන රජතුමා අත්පත් කරගත් බව ද සඳහන් වෙයි. අවශ්‍ය නම් එසේ පවරා නොගැනීමට ද රජතුමාට අධිකාරී බලයක් තිබුණි.

සමහර රජවරුන්ට ඉඩම් පිළිබඳව පුද්ගලික අයිතියක් තිබුණු බවට ද සාක්ෂි ඇත. මෙයට හේතුවී ඇත්තේ රජකමට සුදුසු අය ප්‍රභූ පවුල්වලට අයත්වීම විය හැක. පළමුවන පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1153-1186) සිය මාලිගය ආසන්නයේ පෞද්ගලික උයනක් කරවූ බව මහාවංශයේ සඳහන් වෙයි.  එමෙන්ම යම් රජෙකු මියගිය පසු හෝ බලයෙන් පහවූ පසු පවුලේ අයගේ නඩත්තුව සඳහා දේපළ පැවතුණි.

රජු සතු අයිතිය හා හිමිකම ඉතාම සංකීර්ණ බැවින්  රජු විසින් සිදුකරන ලද ඉඩම් ප්‍රදානයන් ද ඉතා සංකීර්ණ ස්වභාවයක් ගන්නා ලදී. රජු විසින්  ප්‍රදානය කරන ලද ඉඩම්වල සීමාමායිම් පවා ලකුණු කළ බව සඳහන් වෙයි. දේවානම්පියතිස්ස  රජතුමා මිහිඳු මහ රහතන්

වහන්සේට පූජාකරන ලද ඉඩම්වල මායිම් සලකුණු කර ඇත. ඇතෙකු විසින් ඇදගෙන යන නඟුලකින් මෙම මායිම් සටහන් කළ බව පැවසේ. නමුත් බොහෝ ප්‍රදානයන් පිළිබඳව නිශ්චිත සටහන් දක්නට නැත. බොහෝ තැන්වල සඳහන් වන්නේ ඉඩමක්, කුඹුරක් හෝ ගමක් ප්‍රදානය කරන ලද බව පමණි. ගමක් යනු සමහර තැන්වලදී විශාල ඉඩමක් සහිත වුල් කිහිපයක් පදිංචි වූ ප්‍රමාණයේ හෝ නැතිනම් කුඩා හෝ සාමාන්‍ය ප්‍රමාණයේ ඉඩමක් යන්නට ද යෙදෙයි.

රජු විසින් සමහර අවස්ථාවල උපරිම අයිතිය පවරා දෙමින් ද ප්‍රදානයන් කරන ලදී. සමහර අවස්ථාවල රජයට අයවිය යුතු බදුවලින් ද ඉඩම් නිදහස්කර ඇත. විහාරස්ථානවලට පූජා කරන ලද ඉඩම්වලින් කිසිදු බදු මුදලක් අයකරගත්තේ නැත. එමෙන්ම නැවත රජු වෙත නොපවරාගන්නා ආඥා ද නිකුත්කර ඇත.

රජු විසින් ඉඩම් හා ගම්වර ප්‍රදානයන් කළ අවස්ථාවල එහි බදු රජුට නොව එම ඉඩම ප්‍රදානයට ලක්වූ අයට හෝ ආයතනයට ගෙවිය යුතු බව ද සඳහන් විය. නමුත් මෙම ප්‍රදානවලින් එම ඉඩම්වල මෙතෙක් වගාකරගෙන සිටි අයගේ අයිතිවාසිකම්වලට හානියක් නොවන ලෙසට ප්‍රදානයන් සිදුකර ඇත. එමෙන්ම ඔවුන්ගේ සේවාවන් සමග ද මෙම ප්‍රදානයන් සිදුකර ඇත.

රජුගේ ප්‍රදාන ක්‍රමවේදයක් වූයේ ඉඩමේ ආදායම ප්‍රදානය ලත් අයට හිමිවන සහ බදු මුදල් රජුට හිමිවන ලෙසයි. කෙසේ නමුත් ආදායම හා බද්ධ පැහැදිලි ලෙස සඳහන් නොවුන අවස්ථා වේ. මෙම ප්‍රදානයන් රජයේ නිලතල දරණ කාලය සඳහා පමණක් හිමිවන ලෙසට ලබා දුන් අවස්ථාද විය.

කෙසේ නමුත් මෙසේ පුද්ගලයින් අතර ඉඩම් ප්‍රදානයන් හා පැවරීම්වලදී අයිතිවාසිකම් හුවමාරු කරගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රියා පිළිවෙත් පිළිබඳ මූලාශ්‍ර දක්නට නැත. නමුත් අක්ෂර භාවිතය ශ්‍රී ලංකාවේ පැවති හෙයින් සහ වෙනත් කාරණා ගැන සෙල්ලිපි, පුස්කොළ පොත් වැනි දේ ලියා ඇති හෙයින් ඉඩම් පිළිබඳව ද බොහෝ දේ ලියැවී තිබෙන්නට

ඇතැයි විශ්වාස කළ හැක. කෙසේ නමුත් ආගමික ස්ථානපනට හා වෙන්ත විශේෂිත පුද්ගලයින්ට ලබාදුන් හා ප්‍රදානය කළ ඉඩම් පිළිබඳව නම් බොහෝ තොරතුරු තිබේ. තල්පත්වල, ගල්පුවරුවල සටහන් වූ ඉඩම් ගනුදෙනු පිළිබඳ සටහන් පසුකාලීනව I වෙනි විජයබාහුගේ (ක්‍රි.ව. 1070-1110) කාලයේ තඹ පත්වල ද සටහන් වී ඇත.

රාජ සභාවේදී රජු විසින් ආඥාව කියවීමෙන් පසු අදාළ නිලධාරීන් ප්‍රදානයන් ලබන්නන්ගේ අත්පැන් වත්කර එය බලාත්මක කළේය. ක්‍රි.ව. 9වන ශතවර්ෂයෙන් පසු ප්‍රදානයන් කළ රජු, ප්‍රදානය ලද තැනැත්තා හා සාක්ෂිකරුවන් කවුරුන්ද යන්න කරුණු සඳහන් කර ඇත. එමෙන්ම ඉඩමේ දිසාවන් හා ප්‍රදානය කළ දිනයන් ද සටහන් කර ඇත.

පුරාණ ශ්‍රී ලංකාවේ පුරුෂයින්ට මෙන්ම ස්ත්‍රීන්ට ද ඉඩම් අයිතිවාසිකම් සම්බන්ධව සම අයිතීන් තිබී ඇත. රජ පවුල්වල බිසවුන් සහ කුමරියන් ආගමික ආයතනවලට දේපල පැවරීම් සම්බන්ධයෙන් තොරතුරු ඇත. ක්‍රි.පූ. යුගවලදී පවා භික්ෂූන් සඳහා ලෙන් පූජා කිරීම කාන්තාවන් විසින් සිදුකර ඇති බව බ්‍රාහ්මී අක්ෂර සහිත ආදි ශිලා ලිපිවල සඳහන් වෙයි. එමෙන්ම ගජබාහු රජුගේ (ක්‍රි.ව. 114-136) මව කහවනු දහසක් වැය කොට ඉඩමක් මිලදී ගෙන විහාරයක් තනවා ඇත. එමෙන්ම අනුලබි නම් කාන්තාවක් (ක්‍රි.ව. 249-262) ගෝඨාභය රජ දවස ගගපවතනම් විහාරයකට වැවකින් කොටසක් පූජාකළ බව සඳහන් වෙයි. මෙය වැවකින් කොටසක් වුව ද ඉඩම් සම්බන්ධයෙන් තුළ ගනුදෙනුවකි.

භුක්තිය අනුව ඉඩම් වර්ග

අද ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ප්‍රවේණි, අඳ සහ උකස් භුක්ති ක්‍රම කාලාන්තරයක් තිස්සේ පැවත එන ලද බවට සාධක ඇත. මේවා අතරින් ප්‍රවේණි භුක්ති ක්‍රමයේ මුල් ස්වරූපය ලෙසට සැලකිය හැකි "පමුණු ක්‍රමය මුලින්ම සඳහන් වන්නේ ක්‍රි.ව. 9 වන ශත වර්ෂයට අයත් සෙල්ලිපිවලය. වචනය නිශ්චිතව හඳුනාගනු නොලැබුවත් ඊට පෙර සිටම පරම්පරාවෙන් නිශ්චල දේපල හිමිවීමේ සම්ප්‍රදාය අනුරාධපුර රාජධානියෙ ආරම්භයේ සිටම දක්නට ලැබුණි. පමුණු යන වචනයේ තේරුම "ලබාගැනීම" "ලබාගත් " යන්න බව ද විචාරක මතයයි.

පමුණු නින්දගමකට සමාන බවට ද මතයක් පවතී. රජතුමාගේ යුවරජ විසින් පමුණු ඉඩම් ප්‍රකාශයට පත්කරන ලදී. ඉරහඳ පවතිනතාක්කල් එම ඉඩම් ඒ අයුරින්ම තිබිය යුතු බවට සඳහන්වෙයි. පමුණු ඉඩමක් සඳහා බදු ගෙවීමක් හෝ සේවයක් සැලසීම අවශ්‍ය නොවේ. එහෙත් සමහර අවස්ථාවල පමුණු ඉඩම්වලින් ආගමික ආයතනයකට හෝ පුණ්‍ය ආයතනයකට සාපේක්ෂව සුළු මුදලක් ගෙවූ අවස්ථා ද සඳහන් වෙයි.

පමුණු සහ පරවේණි යන පද දෙකම 9වෙනි ශතවර්ෂයේ සිට 14 වෙනි ශතවර්ෂය දක්වා භාවිත වුවත් ඉන්පසු පමුණු යන වචනය අභාවයට ගොස් පරවේණි යන පදය පමණක් භාවිතයට පැමිණ ඇත. මෙම වචනවලින් ගම්‍යවන අර්ථයනම් අනුපිළිවෙළ, සම්ප්‍රදාය, චාරිත්‍රය, භාවිතය යනුවෙනි. "පරම්පරාවෙන් අඛණ්ඩව පැවත එන හෝ පවත්වාගෙන යා හැකි" යන අර්ථය මෙයින් ප්‍රකට වෙයි. එමෙන්ම පසුකාලීනව "නින්දගම්" භුක්ති ක්‍රමයෙ ආරම්භක ස්වරූපයක් ලෙසට ද පෙන්වා දිය හැක.

පමුණු ඉඩම් ලබාගතහැකි විවිධ ක්‍රම පැවතුණි. පරම්පරාවෙන් එන භුක්තිය එක් ක්‍රමයකි. රජු හෝ පුද්ගලයින් විසින් ආගමික ස්ථානවලට ප්‍රදානයන් ලෙස පමුණු ඉඩම් ලැබෙයි. එමෙන්ම යමෙකුට මිලදී ගත හැකිවීම ද තවත් ක්‍රමයකි. රජු විසින් පුද්ගලයින් කරන ප්‍රදානයන් මගින් ද පමුණු ඉඩම් හිමිකම ලැබේ.

කෙසේ නමුත් ඉඩම් භුක්ති ක්‍රමය තුළ ඉහළම හා ශක්තිමත්ම අයිතිවාසිකමක් පැවති පමුණු ඉඩම් ද දරන්නන් ද ඇතැම්විට විවිධ කොන්දේසිවලට යටත් විය. පමුණු ඉඩම් විහාරස්ථානවලට ප්‍රදානය කළ විට ඒවා දිගින්දිගටම එම විහාරයට අයත්ය. පුද්ගලයින්ට දුන්පසු පරපුරෙන් පරපුරට අයත්වෙයි. නිශ්ශංකමල්ල රජු විජය නම් පුද්ගලයකුට දුන් පමුණු ප්‍රදානයක කොන්දේසියක් වන්නේ විජයගේ ඥාතීන් හෝ දරුමුණුපුරන් නොවන කිසිවකුට හෝ මෙය හිමිනොවිය යුතු බවයි. ක්‍රි.ව. 1458 පමණ කාලයේ ලියැවී ඇති මඩවල පර්වත ලිපියෙහි රජු විසින් පරමනයා නම් කම්හල්කරුට ප්‍රදානය කර ඇති බවත්, ඔහුගෙන් පසු ඔහුගේ පුත්‍රයා වූ සුරියාට අයත් විය යුතු බවත් සඳහන්ය.

අඳ භුක්ති ක්‍රමය ද එදා පැරැන්නන් අතර සිට මේ දක්වාම රට තුළ ක්‍රියාත්මක වෙයි. අඳ යන පදය සංස්කෘත "අර්ධ" සහ පාලි අඩ්ඩ යන පදවලින් බිඳී ආ එකකි. භාගයක් යන්න එහි අදහස වෙයි. කුරුධර්ම ජාතකයේ ඇල්කෙත රජ්ජුරුවන්ටත්, මටත් අඳයට කළ දෙයය" යනුවෙන් සඳහන් වෙයි. කෙසේ නමුත් අඳ භුක්ති ක්‍රමය පිළිබඳව සඳහන් වන්නේ දහතුන්වන ශතවර්ෂයට පසු රචිත සාහිත්‍ය මූලාශ්‍රයන්වලය. ඈත අතීතයේදී "අඳ ඉඩම්" ලෙස භාවිත කළේ කුලිය වශයෙන් අස්වැන්නෙන් කොටසක් දෙන පොරොන්දුව මත සාරවත් ඉඩම් වාර්ෂිකව ගොවිතැන් කිරීමයි. අදට ද සම්ප්‍රදායික ගොවි අඳ ක්‍රම දක්නට ලැබේ. අඳය හරි අඳයි සහ කරු අඳය ලෙසට ද වර්ග කළ හැකිය.

හරි අඳය යටතේ අඳ ගොවියා කුඹුරු ඉඩමේ පාලකයාවෙයි. ආරක්ෂාව ලබාදීම හා ශ්‍රමය ලබාගැනීම ද ඔහුගේ කාර්යයකි. ඉඩම් හිමියා කරන්නේ බීජ, පොහොර ආදිය අඳකරුට ලබාදීම පමණි. පලදාව නෙලීමෙන් අනතුරුව ශ්‍රමික කුලිය අඩුකර ඉතිරි අස්වැන්න දෙකට බෙදයි.

කරු අඳය යනු යම්කිසි වගාකන්නයක විවිධ කාර්ය කොටස් සඳහා ගෙවනු ලබන අඳයකි. සීසෑම හා වැපිරීම සඳහා අඳය, බීජ වී සැපයීමේ අඳය, වගා ආරක්ෂාව සඳහා අඳය, ඉඩමේ අයිතිකරුගේ අඳය ආදී වශයෙන් මෙය වර්ග කළ හැක. මෙලෙස ගතහොත් සමහරවිට කන්නයෙන් කන්නය ඒ ඒ වැඩ සඳහා විවිධ අඳ කරුවන්ගේ සේවය ලබාගත හැක.

තට්ටුමාරු ක්‍රමය හවුල් අයිතිකරුවන් අතර වූ කුඹුරක් කන්නයෙන් කන්නය ඒ ඒ හවුල් අයිතිකරුවා විසින් වගා කිරීමයි. එක් හිමිකරුවෙකු එක් කන්නයක් ද අනික් අයිතිකරු ඊළඟ කන්නය ද වගා කරයි. මෙම හවුල් අයිතිකරුවෙකුට අවශ්‍යනම් තමාට අදාළ කන්නය "අඳ" ලෙසට තවත් කෙනෙකුට ලබාදිය හැක.

තට්ටුමාරු ක්‍රමයට කුඹුරු කිහිපයක් වුව ද වගා කළ හැක. එමෙන්ම එකම අඳකරුවෙකු ලවා දිගටම කුඹුරු වගාකිරීමට සලස්වා කන්නයෙන් කන්නයට අදාළ හිමිකරුට අඳ පංගුව ලබාදිය හැක. මෙලෙස බැලීමේදී "අඳය" එක්තරා ආකාරයක සංකීර්ණ ස්වභාවයක් ද උසුලයි.

උකස් ක්‍රමය ද ඉතිහාසයේ සිට පැවත එයි. ඉඩම උකසට තබන්නා පොළිය වෙනුවට ඉඩම උකසට තබයි. එමෙන්ම උගස්කරුට ඕනෑම වෙලාවක මුදල් ගෙවා උකස බේරාගත හැකිය. කරල් බද්ද යන නමින් මෙය තවත් ආකාරයකින් දුම්බර ප්‍රදේශයේ පවතී. මෙහිදී සිදුවන්නේ සම්මුතිය අනුව නියමිත කාලය ගතවූ පසු උකස බේරා ගැනීමයි. පමුණු ඉඩම් උකස් කිරීම හා විකිණීම මිහින්තලා සෙල්ලිපිවලින් තහනම් කර ඇත.

"පාට්ට" යනුවෙන් මිහින්තලා පුවරුවල දක්නට ඇති පදයකි. පාට්ට යනු සිංහලෙන් "බද්ද" යන තේරුමට සමාන වෙයි. විහාර ඉඩම් පාට්ට ඉඩම් වශයෙන් ලබා නොදිය යුතුය යන්න මිහින්තලා පුවරුවල සඳහන් වෙයි. කෙසේ නමුත් පාට්ට වශයෙන් දුන්න ද විහාරගම්වල අයිතිය අන්සතු වී නැත.

කෙසේ නමුත් පාට්ට භුක්තියෙහි නියම ස්වභාවය පැහැදිලි නැත. අප දක ඇති පරිදි සමහර පමුණු බිම්වලින් වාර්ෂික දීමනාවක් ගෙවිය යුතු වූයේය. එක් අවස්ථාවකදී මෙය නිශ්චිත වශයෙන්ම බද්දක් යනුවෙන් හඳුන්වා ඇත. පාට්ට ඉඩම් "නියම කාලයක් සඳහා බදු දීමක්" නම් නිසැකවම පමුණු සහ පාට්ට ඉඩම් අතර ඇත්ත වශයෙන්ම පැවති වෙනස පැහැදිලි කළ හැකිවනු ඇත. බදු මුදලක් තරම විශාල මුදලක් වන්නට ඇත. කෙසේ නමුත් පාට්ට යන වචනය වර්තමානයේ සිංහල භාෂාවේ දක්නට නැත. මෙය සඳහන්ව තිබුණේ මිහින්තලා ලිපිවල පමණි.

දිවෙල් භුක්තිය හෙවත් සේවා භුක්තිය තවත් ක්‍රමයකි. සංස්කෘත "ජීවිත" සහ පාලි "ජීවන" යන පදයන්ට සමාන වූ "දිවෙල්" යන්නෙහි අර්ථය ජීවිතය, පැවැත්ම, නඩත්තුව යන්නයි. එහෙයින් දිවෙල් ඉඩම් යනුවෙන් හැඳින්වනු ලැබුයේ සේවා කාලය තුළ භුක්තිවිඳීම සඳහා රජු විසින් නිලධාරීන්ට පවරන ලද ඉඩම් යැයි සඳහන් කළ හැක. පෙර රජ දවස මුදල් සංසරණය තිබුනත් නිලධාරීන්ට ගෙවීම් කරන ලද්දේ ඉඩම් පැවරීමෙනි. දිවෙල් යන පදය දකගත හැක්කේ 9 වෙනි ශතවර්ෂයෙන් පසුකාලීනවය. නිශ්ශංකමල්ල (ක්‍රි.ව. 1187-1196) රජුගේ ශිලාලිපිවල අමාත්‍යවරුන්ට දිවෙල් දුන් බව සඳහන් වෙයි. එමෙන්ම ඔරුවල නම් ගම සේවාකාලය කළ